දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011 ) 0112698507 , 0112694033 ) 0112675449 , 0112675280

ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866 ) 0112693869 ) 0112692913

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය / எனது இல / My No. ) CF/EXD/08/2021

ඔබේ අංකය / உமது இல / Your No. : )

දිනය / திகதி / Date ) 2021.06.17


# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02-40/2021

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන්
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාළ ආයතන ප්‍රධානීන් වෙත.

**ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 01 සේවා ගණය (MN 06 – 2006 ) A සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021 (දෙවන වාරය)**

ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 01 සේවා ගණය (MN 06 – 2006) A සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරේ I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 01 සේවා ගණය (MN 06 – 2006 ) A සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුරේ I ශ්‍රේණියට උසස්වීමක් ලබා ඇති නිලධාරීන්ගෙන් මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැකිය.

**සැ.යු -: 2021.07.02 දිනට හෝ ඊට පෙර I ශ්‍රේණියට පත්කර අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**

02 **අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් **අධ්‍යක්ෂ (විභාග), සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10** යන ලිපිනයට 2021.07.02 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.**45.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" X 4" ප්‍රමාණයේ ලියුම් කවර 02ක්** එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු. : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 දක්වාත් දෙවන පිටුවේ අංක 5 සිට 8 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

03 **විභාග ගාස්තු**

3.1 විභාගයට පළමුවරට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයයකට රු.25.00 බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

3.2 කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

04 විභාගයට ඇතුළත්කර ගැනීම

4.1 පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත්කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

4.2 විභාග අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකිවිලි අතුරින් එකක් භාරගනු ලැබේ.

[අ] ජාතික හැඳුනුම්පත

[ආ] සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත්කරන ලද හැඳුනුම්පත

[ඇ] වලංගු රියදුරු බලපත්‍රය

[ඇ] වලංගු විදේශ ගමන් බලපත්‍රය

05 විභාග පරිපාටිය

මෙම විභාගය සිද්ධි අධ්‍යයනය යනුවෙන් රචනා ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය. ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 කි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40%ක් ලබාගත යුතුය. කාලය පැය 03 කි.

06 විභාග විෂය නිර්දේශ මාලාව

6.1 සිද්ධි අධ්‍යයනය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සිද්ධි අධ්‍යයනය | අදාළ ක්ෂේත්‍රයට අදාළව නිර්මාණය කරනු ලබන ගැටළු සහගත සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් ආශ්‍රයෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. එමගින් අපේක්ෂකයින්ගේ තර්ක ශක්තිය, නිර්මාණශීලීත්වය, ගැටළු විශ්ලේෂණය යනාදිය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව සහ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳව ඔවුන් තුල පවත්නා අවබෝධය පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. |

07. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

08. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. (මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.)

සැ.යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බල පැවැත්වේ.

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට.
සෞඛ්‍ය අමාත්‍යාංශය

EXD

ආදර්ශ අයදුම්පත

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

**ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 01 සේවා ගණය (MN 06 – 2006) A සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021 (දෙවන වාරය)**

01. (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) ....................................................................................

.......................................................................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) : ....................................................................................

.......................................................................................................................................

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ) (i) I ශ්‍රේණියට පත් කළ දිනය..............................ලිපි අංකය :.....................................................

(ii) දැනට ලැබෙන වාර්ෂික වැටුප ..............................................................................................

(iii) ජංගම දුරකථන අංකය -

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

(iv) ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

02 (අ) දැනට සේවය කරන ආයතනය (සිංහල) ..............................................................................................

(ඉංග්‍රීසි) ..............................................................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ

| | | |
|---|---|---|
| රෝඛීය අමාත්‍යාංශයට | - | |
| පළාත් සභාවට | - | |

(ඇ) පළාත් සභාවටනම් අදාළ පළාත -..............................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය ..............................................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..............................................................................................

(ඊ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) ..............................................................................................

.......................................................................................................................................

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..............................................................................................

.......................................................................................................................................

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) ..............................................................................................

04. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..............................................................................................

(ආ) මෙම විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නොවේනම් මුද්දර ඇලවා තිබේද?

| මුද්දර කොටුව |
|---|
| |

**05. අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු......................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

.................................................................

දිනය ............................................ අයදුම්කරුගේ අත්සන

**06. පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරීයාගේ/ නිලධාරිණියගේ සහතිකය**

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

.......................................................

දිනය :-...................................... නම සහ අත්සන

**07. ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..........................................................................මහතා/මිය/මෙනවිය*..........................................................නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට/නොවන* බවද, රු .......... ක් වටිනා මුද්දර මෙම අයදුම් පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්. මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත් මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

දිනය ......................... ......................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

**08. විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

............................................................මහතා / මහත්මිය / මෙනවිය* ............................................................ නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ........................... ......................................................

විමධ්‍යගත කොට්ඨාශ
විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ
අත්සන [රබර් මුද්‍රාව තැබිය යුතුය]

( * - අනවශ්‍ය කොටස් කපා හරින්න.)